සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/02/Ad/12/ වා:/ස්.මා
ඔබේ අංකය / உமது இல / Your No: ...
දිනය / திகதி / Date: 2016.07.18

චක්‍රලේඛ අංක 2016/10

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වරුන්,

හා සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## දිවිනැගුම කළමණාකරුවන් හා දිවිනැගුම සංවර්ධන නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය - 2017

සියළුම රාජ්‍ය නිලධාරින්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක විය යුත්තේ මාරු මණ්ඩල පිහිටුවා එම නිර්දේශ මතය. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ජේදයේ අදාල විධිවිධාන අනුව කටයුතු කල යුතු අතර ස්ථානමාරු මණ්ඩල සඳහා වෘත්තීය සමිති නියෝජනය එම රීති සංග්‍රහයේ විධිවිධාන අනුව ඊට ඇතුලත් කර ගත යුතුය.

2017 වර්ෂය සඳහා දිවිනැගුම කළමණාකරුවන්ගේ හා දිවිනැගුම සංවර්ධන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉහත විධි විධාන වලට යටත්ව මේ සමඟ ඉදිරිපත් කර ඇති දිවිනැගුම කළමණාකරුවන්ගේ හා දිවිනැගුම සංවර්ධන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව ක්‍රියාත්මක කල යුතුය.

**ස්ථානමාරු මණ්ඩල කොටස් තුනකින් සමන්විත වේ.**

1. අන්තර් දිස්ත්‍රික්ක මාරු මණ්ඩලය
2. දිස්ත්‍රික්කය තුළ මාරුවීම් සඳහා දිස්ත්‍රික්ක මාරු මණ්ඩලය
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මාරුවීම් සඳහා ප්‍රාදේශීය මාරු මණ්ඩල

**අන්තර් දිස්ත්‍රික් ස්ථානමාරු මණ්ඩල සංයුතිය.**

1. අධ්‍යක්ෂ පාලන (සභාපති)
2. සහකාර අධ්‍යක්ෂ (පාලන) (ලේකම්)
3. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) (සාමාජික)
4. වෘත්තීය සමිති නියෝජනයන්

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722**(Hotline) |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

**දිස්ත්‍රික් ස්ථානමාරු මණ්ඩල සංයුතිය**

පහත ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ තුළ මාරු මණ්ඩල සංයුතියට සමාන වන පරිදි දිස්ත්‍රික් ලේකම්ගේ උපදේශකත්වය මත පත් කල හැකිය.

දිස්ත්‍රික් මාරු මණ්ඩල සභාපති දිස්ත්‍රික් ලේකම්ගේ අභිමතය පදිරි පත් කළ හැකි අතර දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගේ නියෝජනය අත්‍යාවශ්‍යවේ.

අනෙකුත් මාරු මණ්ඩල සාමාජිකයන් දිස්ත්‍රික් ලේකම් විසින් තීරණය කරනු ඇත. මේ සඳහා ද දිස්ත්‍රික්කය නියෝජනය වන වෘත්තීය සමිති සාමාජිකයන්ට අවස්ථාව සලසා දෙනු ලැබේ.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ස්ථානමාරු මණ්ඩල සංයුතිය අවම වශයෙන් සාමාජිකයන් 04 ක් වත් විය යුතුය.**

I. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
II. ගණකාධිකාරි (ලේකම්)
III. මූලස්ථාන දිවිනැගුම කළමණාකරු / මහා සංගම් දිවිනැගුම කළමනාකරු දෙදෙනාගෙන් එක් අයෙක් - (සාමාජික)
IV. වෘත්තීය සමිති නියෝජිතයන්

❖ ස්ථාන මාරු මණ්ඩල වෙත ඉදිරිපත් කළ යුතු ලේඛණ

I. ස්ථාන මාරු අයදුම් පත්‍රය
II. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ලේඛණය (02 ආකෘතිය අනුව)
III. එකම සේවා ස්ථානයක අවුරුදු 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ගේ ලේඛණය. (03 ආකෘතිය අනුව)

<u>අභියාචනා මණ්ඩල</u>

ඉහත එක් එක් මාරු මණ්ඩල සඳහා අභියාචනා මණ්ඩලයක් ද පත් කළ යුතුය. ඉල්ලීම් මත මාරුවීම් හෝ සේවා අවශ්‍යතාවය මත වන මාරුවීම් හේතුවෙන් අතෘප්තියට පත්වන නිලධාරින්ට මෙම අභියාචනා මණ්ඩලවලට මෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාල වකවානු නොඉක්මවා අභියාචනා කිරීමට අවස්ථාව ලබාදිය යුතුය.

අභියාචනා මණ්ඩල වලදී ඉහත මාරු මණ්ඩලවල ලේකම් හෝ සභාපති අනිවාර්යෙන්ම සාමාජිකයෙක් විය යුතු අතර ඉතිරි නියෝජිතයන් පත් කිරීම ප්‍රදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ තීරණය මත සිදුවේ.

ස්ථානමාරු ලබා දීමේ දී හැකි සෑම විටකම නිලධාරියාට සහනයක් ලැබෙන සේ ස්ථානමාරු කිරීම කළ යුතුය. එසේ වුවත් සේවා අවශ්‍යතාවය ප්‍රමුඛ විය යුතු බවද විශේෂයෙන්ම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටු කෙරෙන සියළුම සංවර්ධන කාර්යයන්ට බාධාවක් නොවන ලෙස ස්ථානමාරු සැලසුම් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

<u>ස්ථානමාරු කාල සටහන</u>

- ජූනි 15 ට පෙර ස්ථාන මාරු මණ්ඩල පත් කිරීම හා ස්ථාන මාරු පටිපාටිය සකස් කිරීම.
- ජුලි 31 දිනට ස්ථාන මාරු ඉල්ලුම් පත් කැඳවීම.(මාරු කිරීමේ පරිපාටියට අනුකූලව ඉදිරිපත් කරන ඉල්ලීම් පමණක් පිළිගනු ලැබේ.)
- සැප්තැම්බර් 15 දිනට පෙර අදාල නිලධාරියා වෙත ස්ථාන මාරු තීරණ දැන්වීම
- සැප්තැම්බර් 30 දින තෙක් අභියාචනා භාර ගත යුතුය.
- ඔක්තෝම්බර් 15 දිනට පෙර අභියාචනා මණ්ඩල තීරණ දැන්වීම

**නිලධාරින්ගේ වගකීම්.**

I. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියළුම නිලධරයන් නියමිත දිනයෙදී නව රාජකාරී ස්ථාන වෙත සේවය සඳහා වාර්තා කල යුතුය.

II. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්ම කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පටිපාටික රීති 214, 215, 216, 217 වගන්තිවල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

III. මෙම චක්‍රලේඛයේ දක්වා නොමැති විවිධිධාන සම්බන්ධයෙන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

IV. මෙම චක්‍රලේඛය අංක 1589/30 දරණ 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පිරිච්ඡේදයේ 202 වගන්තිය අනුව නිකුත් කරනු ලැබේ.

මාරුවීම් ඉල්ලුම් පත්‍රයේ සඳහන් සියලු තොරතුරු නිවැරදිව සැපයීමට වගබලා ගත යුතුය අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.



යූ.ජී.රංජිත් ආරියරත්න,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.).

## දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

## දිවි නැගුම කළමණාකරු හා දිවි නැගුම සංවර්ධන නිලධාරි වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය - 2017 වසර

2017 වර්ෂය ආරම්භයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති දිවි නැගුම කළමණාකරු හා දිවි නැගුම සංවර්ධන නිලධාරි වාර්ෂික ස්ථානමාරු වැඩසටහනේ දී උපයෝගි කර ගන්නා ප්‍රතිපත්ති පහත දැක්වේ.

**01. වාර්ෂික ස්ථානමාරු ඉල්ලා සිටීමට හිමිකම ලබන නිලධාරින්**

i. මුල් පත්වීම් දිනයේ සිට අවම වශයෙන් අවුරුදු 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්
ii. ප්‍රිය මනාප සේවා ස්ථානයක වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්
iii. ප්‍රිය මනාප සේවා ස්ථානයක වසර දෙකක් සේවය කර ඇති නිලධාරින් මුළු සේවා කාලය නොසලකා දුෂ්කර සේවා ස්ථානමාරු ඉල්ලා ඇති විට දී.

**02. නිලධාරින් විසින් ඉල්ලීම් නොකරන ලද අවස්ථාවකදී සේවා අවශ්‍යතාවය මත පහත සඳහන් නිලධාරින් වාර්ෂික ස්ථාන මාරුවලට යටත් කළ හැකිය.**

1. කිසියම් සේවා ස්ථානයක වසර 05 ක සේවය සම්පූර්ණ කර ඇති නිලධාරින්
2. වාර්ෂික ස්ථාන මාරු ලැබීමට හිමිකම් ඇති නිලධාරින් සඳහා අනුප්‍රාප්තිකයන් යෙදීමේ දී ඉහත 2 i නිලධාරින් ඒ සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුය.
3. නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරුවීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3.1 හැකි සෑම විට ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ස්ථාන මාරු ඉල්ලීම් 03 න් එකකට ස්ථානමාරු කිරීම.

3.2 ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත නම් එකම ප්‍රදේශයක සේවය කිරීමට අවස්ථාව ලබාදීමට උපරිම උත්සහය යොදනු ඇත.

සෑම ස්ථාන මාරුවක්ම ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ලබා දිය යුතුය.

3.3 ප්‍රිය මනාප නොවන සේවා ස්ථාන සඳහා සේවා අවශ්‍යතාවය මත නිලධාරින් මාරු කිරිමේ දී පළමුව අවිවාහක නිලධාරින් ද, දෙවනුව අනෙකුත් නිලධාරින්ද වශයෙන් තෝරා ගත යුතුය.

3.4 වයස අවුරුදු 53 ඉක්මවන ලද නිලධාරින්ගේ ඉල්ලීම මත මිස දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකල යුතුය. (එසේ වුවද විනය කරුණු සඳහා මෙය බල නොපායි.)

3.5 වෘත්තීය සංගමයක මව් සංගමයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක සභිකයින් මාරු කරන්නේ නම් අදාල වෘත්තිය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගත යුතුය.

3.6 ප්‍රිය මනාප සේවා ස්ථානවල සේවය කරන නිලධාරින් තවත් ප්‍රිය මනාප සේවා ස්ථානයකට කරනු ලබන ඉල්ලීම් සලකා බලන්නේ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානවල සේවය කල නිලධාරින්ගේ ඉල්ලීම සලකා බැලීමෙන් පසුවය.

3.7 සමාජ සංවර්ධන සහකාරවරුන් හා සමාජ ආරක්ෂණ නිලධාරින් ස්ථාන මාරු කිරීමේ දී හැකි සෑම විටම ආයතනයේ පැවැත්මට බාධාවක් නොවන සේ ස්ථාන මාරු කල යුතුය.

3.8 ක්ෂුද්‍ර මුල්‍ය බැංකු වල සේවය කරන නිලධාරින් මාරු කිරිමේදී බැංකු රාජකාරිවලට බාධා සිදු නොවන පරිදි අන්තර් බැංකු මාරුවීම් ක්‍රමයක් අනුගමනය කළ යුතුය.

**<u>පහත දැක්වෙන ස්ථානමාරුවීම් සඳහා මාරු මණ්ඩල නිර්දේශ අවශ්‍ය නොවේ.</u>**

1. කාර්ය ස්ථානයේ වෙනසක් නොවන ස්ථාන මාරුවීම්
2. විනය හේතු මත කෙරෙන ස්ථාන මාරුවීම්
3. සේවා අවශ්‍යතාවය මත කල යුතු ස්ථාන මාරුවීම්
4. රජයේ නිලධාරින්ගේ ඉල්ලීම් මත කරනු ලබන සුහද ස්ථානමාරු

සේවා අවශ්‍යතාවය මත කරන ස්ථාන මාරුවීම් අදාල වෘත්තිය සමිති නියෝජිතයන් වෙත දැන්විය යුතුය.

ප්‍රජා මූල බැංකු හා බැංකු සංගම්වල නිලධාරින් සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමේදී අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මුල්‍යගේ නිර්දේශය ලබාගත යුතුය.

විගණන අංශයට අනුයුක්ත කළමණාකරුවන්ගේ ස්ථාන මාරුවීම් සඳහා ඉහත පරිපාටිය මෙන්ම ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ නිර්දේශය සැලකිල්ලට ගත යුතුය.

අන්තර් දිස්ත්‍රික් ස්ථානමාරු ලැබූ නිලධාරින්ගේ ලේඛන ඔක්තෝම්බර් 30 දිනට ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වලට එවීමට කටයුතු කරනු ලැබේ.

එහෙත් එම ලේඛන ලැබීමට පෙර වුවද ඔබගේ මාරුවීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට එය බාධාවක් කර නොගත යුතුය.

ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත්‍ර පිළිබඳ සලකා නොබලන අතර ස්ථානමාරු සඳහා අවසන් තීරණය ගැනීමේ බලය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

**සේවා කාලය ගණනය කිරිම**

වාර්ෂික ස්ථාන මාරුවලදී කාල ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය (2017 වාර්ෂික ස්ථාන මාරු වීම සඳහා 2016.12.31 දිනට)

වා.ස්.මා.01

**දිවිනැගුම කළමණාකරු හා දිවිනැගුම සංවර්ධන නිලධාරි අන්තර් දිස්ත්‍රික්, දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාන මාරු කිරීමේ අයදුම්පත**

| අන්තර් දිස්ත්‍රික් | දිස්ත්‍රික්කය තුළ | ප්‍රා.ලේ.කොට්ඨාශය තුළ |
|---|---|---|

**(අදාල නොවන කොටුව කපා හරින්න)**

01. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ........................................................................................
02. ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................................................................
03. තනතුර :- ........................................................................................
04. වර්තමාන සේවා ස්ථානය (මූලස්ථාන/වසම/බැංකුව/මහාසංගමය/ක්ෂුද්‍ර මූල්‍ය බැංකුව ආදී වශයෙන්):- ........................................................................................
05. උපන් දිනය :- ........................................................................................
06. 2016.12.31 දිනට වයස :- ........................................................................................
07. ස්ත්‍රී පුරුෂ භාවය :- ........................................................................................
08. නිලධාරියා පදිංචි ස්ථානය :-
    i. ස්ථිර ලිපිනය :- ........................................................................................
    ii. තාවකාලික ලිපිනය :- ........................................................................................
09. සේවා විස්තර
    i. සේවයට බැඳුනු දිනය :- ..............................................................
    ii. මුල් සේවා ස්ථානය :- ..............................................................
    iii. සේවයට බැඳුනු මධ්‍ය :- ..............................................................

| සිට - දක්වා | මුළු සේවා කාලය (වසර) | සේවා ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**(සියළුම සේවා කාලයන් අඛණ්ඩව සටහන් කරන්න)**

10. නිලධාරියා විවාහක, අවිවාහක, වැන්දඹු, දික්කසාද බව :- ..............................................................
    i. විවාහක නම් කලත්‍රයාගේ නම :- ..............................................................
    ii. කලත්‍රයා රැකියාවක නියුතු නම්,
    සේවය කරන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / වෙනත් :- ..............................................................
    iii. තනතුර :- ..............................................................
    iv. සේවා ස්ථානය :- ..............................................................
    v. දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :-
        1. ..............................................................
        2. ..............................................................
        3. ..............................................................
        4. ..............................................................

vi. පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් දැනට ඉගෙනුම ලබන පාසල් :-

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

11. i. අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු වලදී මාරුවීමට කැමති දිස්ත්‍රික්ක 03 ක් පිළිවෙලින් නම් කරන්න. ප්‍රධාන කාර්යාලයට ද ඉල්ලුම් කළ හැකිය (අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති නිලධාරින් පමණයි)

1. ................................................................
2. ................................................................
3. ................................................................

ii. දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුවීම් වලදී සේවය කිරීමට කැමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් නම් කරන්න. (දිස්ත්‍රික්කය තුල ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති නිලධාරින් සඳහා පමණි.)

| **දිස්ත්‍රික්කය** | **ප්‍රා.ලේ.කොට්ඨාශය** |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාන මාරුවීම් වල දී බැංකු හෝ වසම් 03 ක් නම් කරන්න. මහා සංගමය හා මූලස්ථානය ද ඉල්ලුම් කල හැකිය. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාන මාරුවීම් ඉල්ලීම් කළ නිලධාරින් සඳහා පමණි.

1. ................................................................
2. ................................................................
3. ................................................................

12. ස්ථාන මාරුවීම් ඉල්ලීමට හේතුව කෙටියෙන් පැහැදිලිව සඳහන් කරන්න.

....................................................................................................................................................
....................................................................................................................................................
....................................................................................................................................................
....................................................................................................................................................
....................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බවට ප්‍රකාශ කරමි.

................................................ ................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**<u>අන්තර් දිස්ත්‍රික්ක / දිස්ත්‍රික්ක තුළ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිර්දේශය</u>**

අදාල නොවන කොටස කපා හරින්න.

**දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂ**

සුදුසු අනුප්‍රාප්තියකු සහිතව / රහිතව ස්ථාන මාරුවීම නිර්දේශ කරමි / නොකරමි

...................................................... ......................................................

දිනය ප්‍රාදේශීය ලේකම්

**<u>අධ්‍යක්ෂ ජනරාල් (දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව)</u>**

සුදුසු අනුප්‍රාප්තියෙකු සහිත / රහිතව ස්ථාන මාරුවීම නිර්දේශ කරමි / නොකරමි.

...................................................... ......................................................

දිනය දිස්ත්‍රික් ලේකම් (දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ)

<u>මාරු මණ්ඩල නිර්දේශය</u>

සුදුසු අනුප්‍රාප්තියෙකු සහිත / රහිතව ස්ථාන මාරුවීම නිර්දේශ කරමි / නොකරමි.

.............................................. ..............................................

මාරු මණ්ඩල ලේකම් මාරු මණ්ඩල සහාපති

.............................................. ..............................................

දිනය දිනය

**මාරු මණ්ඩල සාමාජිකයාගේ නම අත්සන**

1. .................................................................... ..................................
2. .................................................................... ..................................
3. .................................................................... ..................................
4. .................................................................... ..................................